# අඟහරුට මහපොළවෙන් අභියෝගයක්

සූර්යයාගේ පිරිවර වශයෙන් හිරුවටා භ්‍රමණය වන ග්‍රහයෝ මිනිසුන් කෙරෙහි බලපාති. අනාදිමත් කාලයක් මුලුල්ලේ මිනිස්සු මෙය විශ්වාස කළහ. 'ග්‍රහයෝ මිනිසාට බලපාති'යි කියන අදහස හුදෙක්ම අවිද්‍යාත්මක මතයක් නොවේ. පෘථිවියේ ගහ-කොළ සහ සෙසු



ජීවීහු ද සූර්යයාගේ සහ ග්‍රහයන්ගේ බලපෑම්වලට ගොදුරු වෙති. මේ චින්තනය විද්‍යාත්මකය.

එහෙත්, මිනිසා විද්‍යාවෙන් හා තාක්ෂණික ශක්තියෙන් ප්‍රගතියට පත්වන විට, මේ ක්‍රියාදාමයෙහි අලුත් පැත්තක් ඉස්මතුවේ. එදා ග්‍රහයෝ මිනිසා කෙරේ බලපෑහ. එහෙත්, අද මිනිසා ග්‍රහයන් කෙරෙහි බලපාන්නට පටන්ගෙන සිටිති. ග්‍රහයන්, මිනිසා කෙරේ බලපාන තුරු, අකර්මන්‍යව බලා සිටින්නේ නැතිව, අද මිනිසා ග්‍රහයන් පරීක්ෂාකොට බැලීමේ ප්‍රබල ප්‍රයත්නයක යෙදී සිටී.

මිනිසා ග්‍රහයන් කෙරේ බලපාන්නට පටන් ගැනීමේ මූලික පියවර සිදුවූයේ මීට විසිහත් වසරකට පෙර, ඇමෙරිකානු අජටාකාශගාමීන් දෙදෙනෙකුවන නීල් ආම්ස්ට්‍රෝං සහ එඩ්වින් ඕල්ඩ්‍රිං සඳතලය මත පා තැබීමෙනි. චන්ද්‍රයා සූර්යයාගේ ග්‍රහයෙක් නොව අපගේ පෘථිවියේ 'ග්‍රහයෙකි.' එහෙත්, නියත වශයෙන්ම මිනිසා සූර්යයාගේ ග්‍රහයෙකු පරීක්ෂාකොට බලන්නට පටන්ගෙන වැඩිකලක් ගතවූයේ නොවේ. මිනිසාගේ තියුණු විද්‍යාත්මක බැල්මට මුලින්ම ලක්වී සිටින ග්‍රහයා අඟහරුයි. අඟහරු අපගේ ඉතාම කිට්ටු ග්‍රහ අසල්වැසියා නිසා ඒ ග්‍රහයා ගැන කරුණු විමසීම සුදුසුය. එසේම, අඟහරු පර්යේෂණවල යෙදීම සෙසු ග්‍රහලෝක පරීක්ෂාකොට බලනවාට වඩා තාක්ෂණික වශයෙන් පහසුය. ලාබය.

අඟහරු ග්‍රහයා පිළිබඳව කෙරෙන විද්‍යාත්මක ගවේෂණ, බොහෝ දෙනාගේ අවධානයට ලක්වන්නට පටන් ගත්තේ ඉතා මෑතක සිටයි. විද්‍යාඥයන් අඟහරු ග්‍රහලෝක පරීක්ෂණ ව්‍යාපාර ගැන දැන සිටියද, සාමාන්‍යය මිනිසාට ඒ පිළිබඳව තරමක හෝ හැඟීමක් ඇතිවූයේ දැනට අඟහරු තලය මත සැරිසරන 'සෝජර්නර්' නම් ඉතා කුඩා රථය නිසාය. මේ රිය සෙල්ලම් මෝටෝ රථයක් තරම් වෙයි. එය දිගින් සෙන්ටිමීටර්

**එඩ්වින් ආරියදාස විසිනි**

64 කි. උසින් සෙන්ටිමීටර් 91 කි. මෙය, පෘථිවියේ සිට සූර්යයාගේ වෙන ග්‍රහයෙකු වෙත ගොස් එහි තලය මත සංචාරය කළ ප්‍රථම යානයයි. (මීට පෙර, සඳතලය මත ඇතැම් යානා ගමන් කළ බව ඇත්තයි. එහෙත්, සඳ, සූර්ය ග්‍රහයෙක් නොවේ.) අඟහරු තලය මත ඒ යානය ගමන් කරන්නේ ඉතාම හෙමිහිටයි. මක්නිසාද යත් එය වේගයෙන් ගමන් කළහොත් එයට අනතුරක් සිදුවී එය විනාශ වී යාහැකි හෙයිනි. එවිට ඒ සඳහා වැය කළ ධන සම්භාරය සහ තාක්ෂණික ඥාන සම්භාරයත් නිකරුනේ නාස්ති වෙයි. මේ රථයේ සාමාන්‍ය ගමන් වේගය විනාඩියකට සෙන්ටි මීටර් 61 කි. (පැයට මීටර් 37 කි.) එහි රෝද හයකි. ඒ රෝද එක එකක්ම ස්වාධීනව ක්‍රියා කරයි. එහි කැමරා දෙකකි. ඉස්සරහින් කළු-සුදු කැමරා දෙකක් වෙයි. පසුපස සවිකළ කැමරාවෙන් වර්ණ ඡායාරූප ලද හැකිය. ශ්‍රී ලංකාවේ විද්‍යාඥයෙකුවන සරත් ගුණපාල, මේ යානයේ අධෝරක්ත කැමරාව සකස් කළ විද්‍යාඥ කණ්ඩායමයට අයත් වූයේය. යානය යන මඟ ගැන සුපරීක්ෂාකාරීවන ලේසර් ධාරා පහක්, එයට නිරුපද්‍රිතව ගමන් කරන්නට උපකාරවෙයි. යානය ප්‍රධාන වශයෙන්ම බලශක්තිය ලබා ගන්නේ සූර්ය තාපයෙනි. ඒ සඳහා එහි ඉතා තුනී සෛල 200 කටත් අධික ප්‍රමාණයක් සවිකොට ඇත්තේය. ලිතියම් ඩී-සෛලනම් බැටරි (බලශක්ති කෝෂ) නවයක් එහි සවිකොට තිබෙතත්, භාවිතකොට ඉවරවූ කල්හි ඒවාට යළි නව පණ කැවිය හැකි නොවේ. සූර්යතාප බලශක්ති කෝෂවලට නව පණ ගැන්විය හැකිවනු පිණිස යානය වරින්වර ක්‍රියාවිරහිතව 'නිදගනී.' නිදිගත් කාලයේ එකතුවන බලය භාවිත කරමින් යළිත් එය ක්‍රියාශීලී වෙයි. අඟහරු තලය මත සිට

*මීට අවුරුදු 21 කට පෙර, 1976 දී වෛකිං යානය අඟහරුතලය මතට ගොඩ බැස්සේය. එයත්, පාත් ෆයින්ඩර් යානය මෙන්ම, අඟහරු තලය මතට ගොඩබැස්සේ ඒ වෂීයේ ජූලි මස 4 වන දය. ජූලි මස හතරවනද, ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ නිදහස් දිනයයි. වෛකිං යානයේ අරමුණ වූයේ අඟහරු තලයෙහි ජීවීන් සිටීදැයි පරීක්ෂාකොට බලනු පිණිස පර්යේෂණ තුනක් පැවැත්වීමය.*

### අඟහරු ග්‍රහයාගේ හැඳුනුම්පත

**නම:** අඟහරු (කුජ, රතු ග්‍රහයා, යුද සෙනෙවි ග්‍රහයා ආදී අපර නාමවලින්ද හැඳින්වේ.)

**වාසස්ථානය:** සූර්යාගේ සිට සිව්වන ස්ථානයේ වෙසෙන ග්‍රහයායි. පෘථිවියේ අසල්වැසියායි.

**වර්ෂය:** දින 687 කි.

**දිනය:** පැය 24.67 යි.

**රූපය:** විෂ්කම්භය කිලෝමීටර් 6750. ධ්‍රැව පෙදෙස් තරමකට පැතලිය.

**වයස:** අවුරුදු කෝටි 480 ක් පමණ වේ.

**පෙනුම:** පෘථිවියේ සිට බලනවිට රතුපැහැයට හුරුව පෙනේ.










පෘථිවියට සංඥාවක් එවන්නට විනාඩි 11 ක් ගතවන්නේය. යානයේ 'මොළය' නැති තිබෙන්නේ සරළ කුඩා පරිගණක පෙත්තකිනි. අඟහරු තලයේ ගල් සහ පස් 'සිඹ' බලා පරීක්ෂා කරනු පිණිස එහි කුඩා උපකරණයක් වෙයි. එය අල්ෆා-ප්‍රෝටෝන් එක්ස්-කිරණ ස්පෙක්ට්‍රොමීටර් (කිරණධාරා මාණකය) නම් වේ. ගල් පස් නැති තිබෙන ආකාරය දැනගන්නට එය ප්‍රයෝජනවත්ය. ඒ ගල් තුළ රත්වැනි ලෝහ ඇද්දැයි කියාත් ඒ මාණකයට අවබෝධකොට ගත හැකිය.

මේ ග්‍රහ පර්යේෂණයෙහි පාලනය භාරව සිටින්නේ ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ නාසා (ජාතික අජටාකාශ සහ අභ්‍යාවකාශ) ආයතනයේ අංශයක් වන ජෙට් ප්‍රොපල්ෂන් පර්යේෂණාගාරයයි. අඟහරු තලය මත තිබෙන උපකරණ ක්‍රියාවේ යොදවන මේ පර්යේෂණාගාරය පිහිටියේ කැලිෆෝනියා ජනපදයේ පැසඩේනා පෙදෙසේයි.

මේ පර්යේෂණය නම් කෙරෙන්නේ 'පාත්ෆයින්ඩර්' (පුරෝගාමියා) වශයෙනි. මේ යානය, අජටාකාශ ගත කරන ලද්දේ 1996 යේ දෙසැම්බර් දෙවනදය. යානය අඟහරු තලය මතට ගොඩබැස්සේ 1997 තේ ජූලි මස හතරවනදය.

මාස 26 කට වරක් පෘථිවිය හා අඟහරු ග්‍රහයා එකිනෙකට කිට්ටුවෙති. 1997 තේ ජූලි හතරවනද සිට අඟහරු ග්‍රහයා සිටියේ පෘථිවියට කිලෝමීටර් දහනවකෝටියක් ඈතිනි. එහෙත්, 1996 යේ දෙසැම්බර් දෙවනද සිට, පාත්ෆයින්ඩර් යානය අඟහරු තලයට ළඟාවීමට, කිලෝමීටර් හතළිස් නව කෝටි හැට ලක්ෂයක් දුරැති මඟක ගමන් කළේය. මෙයට හේතුව ඒ යානයේ පථය වලයාකාර වීමයි. යානය අඟහරුතලයමතට බැස්සේ අවස්ථා කිහිපයකිනි. අඟහරුතලයට කිලෝමීටර් 11 ක් ඉහළදී 'පාත් ෆයින්ඩර්' යානයේ පැරචුටය විවෘත වූයේය. පැරචුටය දිගින් මීටර් 13 කි. යානය අඟහරු තලයට බසින්නට පෙර බැලූන රැසක් පණ ගැන්වූයේය. ඒ බැලූන් බෝල මිටිය අඟහරු තලය මතට පතිත වූණේ පැයට කිලෝමීටර් 35 ක වේගයෙනි. ඒ බෝලය "බම්ප්" වෙමින් (පනිමින්) ගොස් නැවතුනේය. එය නැවතුනේ හරි අතට හැරීගෙනයි. බැලූන් බෝලවල හුළං බැස්සේය. එය තුළ තැන්පත්ව තිබුණු සෝජර්නර් රථය කෙමෙත් කෙමෙත් එළියට ආයේය.



වයිකිං යානය ගොඩ බසී

පාත් ෆයින්ඩර් අඟහරු පර්යේෂණය සඳහා වැයවූ මුදල ඩොලර් කෝටි 25 කි. පර්යේෂණ කාර්යය සම්පූර්ණ කරන්නට අවුරුදු හතරක් ගතවූයේය. 1976 යේදී අඟහරු තලයට යවන ලද වෛකිං යානා සඳහා ඩොලර් කෝටි 300 ක් වැය වූයේය. යානය ගමන් කළේ අඟහරු තලයේ "ආරිස් වැල්ලිස්' නම් වූ ඉපැරණි නිම්න භූමියකටයි. මේ නිම්න භූමිය නැති තිබෙන්නේ මීට අවුරුදු කෝටි සිය ගණනකට පෙර සිදුවූ මහා ජලගැලීම් කිහිපයෙකිනි.

ඒ නිම්නයේ පිහිටි ගල් කුළු ඇතැම්විට, ඒ ජල ගැල්මවල් නිසා ඒ පෙදෙසට ගසාගෙන ආ ඒවා විය හැකිය.

පෘථිවියේ විද්‍යාඥයන් ඒවා නම් කළේ සුප්‍රසිද්ධ කාටූන් චරිතවල නම්වලිනි. යෝගි, ස්කූබි, කැස්පා ආදී වශයෙනි.

මේ යානය විසින් මෙතෙක් එවා තිබෙන ඡායාරූප හා තොරතුරු අංශ ප්‍රමාණය දශලක්ෂයද ඉක්මවන්නේය. ඒ නිම්නයේ ඈත ක්ෂිතිජයෙහි කඳු මුදුන් යුගලයක් දැකිය හැකි වේ. මුළු බිම් පෙදෙසම ගල්කුළු සහිත හෙයින් පෘථිවියේ විද්‍යාඥයන් ඒ පෙදෙස නම් කරන්නේ "ගල් උයන" වශයෙනි.

මීට අවුරුදු 21 කට පෙර, 1976 දී වෛකිං යානය අඟහරුතලය මතට ගොඩ බැස්සේය. එයත්, පාත් ෆයින්ඩර් යානය මෙන්ම, අඟහරු තලය මතට ගොඩබැස්සේ ඒ වෂීයේ ජූලි මස 4 වන දය. ජූලි මස හතරවනද, ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ නිදහස් දිනයයි. වෛකිං යානයේ අරමුණ වූයේ අඟහරු තලයෙහි ජීවීන් සිටීදැයි පරීක්ෂාකොට බලනු පිණිස පර්යේෂණ තුනක් පැවැත්වීමය. එහෙත්, වෛකිං යානය අඟහරු තලය මත ගමන් කළේ නැත. එය, පර්යේෂණ පැවැත්වූයේ එකම තැනක සිටිමිනි. ඒ යානය විසින් එවන ලද තොරතුරු සම්භාරය ඉන් පසුව කෙරුණු ව්‍යාපාර සඳහා බොහෝ සේ ප්‍රයෝජනවත් විය. 1976 යේ අඟහරු තලය මතට ගිය වෛකිං යානය 1982 දක්වාම පෘථිවියට තොරතුරු එව්වේය. එය විසින් ඡායාරූප 52,000 ක් එවන ලදී. අඟහරුගේ චන්ද්‍රයා වන ෆෝබොස් ගේ සමීප රූපයක් ද එවන ලදී. අඟහරු තලයේ බිම් ප්‍රමාණයෙන් සීයට 97 ක පමණ සිතියම් සැපයූ වෛකිං යානය, අඟහරු තලයේ උත්තර ධ්‍රැවයෙහි මිදුණු දිය තැන්පත්ව තිබේ යැයි දක්වා සිටියේය. අඟහරු තලය පිළිබඳව කෙරෙන පර්යේෂණ සියල්ලෙහිම මුඛ්‍යාදධ්‍යාංශ*ය ප්‍රධාන අරමුණ - අඟහරු තලයෙහි ජීවීන් ඇද්දැයි සෙවීමයි.

### අඟහරු තලයෙහි ජීවීන්

සෝජර්නර් යානය විසින් එවන ලද ප්‍රථම ඡායාරූප මාලාව පරීක්ෂා කොට බැලූ ආතර් සී. ක්ලාර්ක් සිය විස්මය පළ කළේය. ඉන් නොනැවතී ආචාර්ය ක්ලාර්ක් ඉතාම පුදුම උපදවන ප්‍රකාශයක්ද කළේය. ඔහු



සෝජර්නර් රෝවරය යෝගි ගල්කුළ පිරික්සමින්

කියා සිටියේ අඟහරු තලයෙහි ඉතාම සූක්ෂම හෝ ජීවීන් සිටිය හැකි බවයි. යම්කිසි ග්‍රහලෝකයක වරක් යම්කිසි ජීව විශේෂයෙක් පහළවී නම්, ජීවය එහි දිගටම පැවතී යන්නේ යැයි ආතර් සී. ක්ලාර්ක් කීයේය. අඟහරු තලයෙහි ක්ෂුද්‍ර ජීවීහු සිටියහ'යි කියන අදහස් තහවුරු වූයේ 1996 යේ අගෝස්තු මාසයේදී පළ වූ ප්‍රවෘත්තියකිනි. ඒ පිළිබඳව කථාව, විද්‍යා ප්‍රබන්ධයක් තරම් රසවත්ය. මෙයට අවුරුදු එක්කෝටි හැට ලක්ෂයකට පෙර විශාල ග්‍රහකයෙක් හෝ උල්කාපාතයක් අඟහරුතලය මතට ඇද වැටුනේය. දූවිලි ලෙස අඟහරු තලය මත එය පතිතවූයේ ජලකර බෝම්බ දශ ලක්ෂයක් පුපුරන වේගයෙනි. ඒ ගැටුම නිසා අඟහරු තලය මත මහා ආවාටයක් හැරුනේය. එමෙන්ම, ඒ කම්පනය නිසා ගල්කුළු, ගල්කැට හා පස් අඟහරු ඉහළ අහසට විසිවී ගියේය. ඒ සුන්බුන්වලින් බොහොමයක් අඟහරු තලය මතට ආපසු වැටුණේය. එහෙත්, ඇතැම් සුන්බුන් ඉතා මහා වේගයකින් ඉවත විහිද ගිය නිසා ඒවා අඟහරු ග්‍රහයාගේ ගරුත්වාකර්ෂණයෙන් මිදී භ්‍රමණය වන්නට විය. අවුරුදු දශ ලක්ෂ ගණනක් එසේ භ්‍රමණය වූ ගල් කැබැල්ලක් මීට අවුරුදු 13,000 කට පෙර පෘථිවිය මතට වැටුනේය. දක්ෂිණ ධ්‍රැවයේ ඇන්ටාටිකාවේ 'ඇලන් හිල්ස්' යැයි නම් කෙරුණු හිම තලාවකට ඇද වටුණු ඒ අඟහරු උල්කාපාත කැබැල්ල විද්‍යාඥයන් විසින් සොයා ගන්නා ලද්දේ 1984 රේදීය. දෙළොස් වසක පර්යේෂණවලින් පසුව මේ රාත්තල් 4.2 ක් ගල් කැබැල්ලෙහි ක්ෂුද්‍ර ජීවියෙකුගේ පොසිලයක් පාෂාණීභූත නෂ්ටාවශේෂ තැන්පත්ව තිබුණු බවයි. මේ අනන්ත විශ්වයේ මිනිසා හුදෙකලා සත්වයෙකු නොවන බවත්, අඟහරු තලයෙහි ජීවීන් සිටිය බවත් ඉන් අනාවරණය වූයේය.

එහෙත්, ක්ෂුද්‍ර ජීවීන් හැර වෙනත් අතික් වර්ගවල ජීවීහුද අඟහරු තලයෙහි සිටිතිද?

විද්‍යාඥයන් විසින් පළ කෙරෙන මතය නම් අඟහරු තලය වියළි ශීතල පෙදෙසක් හෙයින් එහි විශාල ප්‍රමාණයේ ජීවීන් හටගන්නට ඉඩ ඇති බවයි.

අඟහරු තලයෙහි ප්‍රධාන වර්ග කීපයක ජීවීන් සිටිය හැකි යැයි විද්‍යාඥයෝ සිතති. ඉන් එක් වර්ගයක් ශෛලභෝජකයන් (පෙට්‍රොෆේග්) විය හැකිය. ඉන් ඇඟෙන්නේ 'ගල්කන' සතුන් යන්නයි. මේ 'ගල් කන්නන්' උන්ට අවශ්‍ය ජලය හා ඛණිජ වර්ග ලබාගන්නේ ගල්වලින් විය හැකි යැයි විද්‍යාඥයෝ අනුමාන කරති.

අතික් වර්ගය නම් හිම භෝජකයෝයි. (ක්‍රිස්ටොෆේග්) උන් අඟහරුතලය යට ඇති ස්ථාවර හිමෙන් ජලය උරාගනිතියි විද්‍යාඥයෝ සිතති. තෙවන වර්ගය වශයෙන් සැලකෙන්නේ ඝන කබොල්ලක් සහිත සත්වයෝයි. ඒ ඝන කටුවෙන් උන්ට සූර්ය කිරණයෙන් ලැබෙන ප්‍රබල පාරජම්බුල කිරණයට ඔරොත්තුදී සිටිය හැකිය. මිනිසා විශ්වය අධ්‍යයනය කරන්නට පටන්ගත් තැන් පටන්ම, විද්‍යාඥයන්ගේතියුණු ඇස යොමුවුණේ අඟහරු ග්‍රහයා දෙසටයි. මුල් කාලයේ දුර දක්න තුළින් අඟහරු ග්‍රහයා දෙස බැලූ පැරණි විද්‍යාඥයෝ අඟහරු තලයේ ඇළ මාර්ග වැනි ලක්ෂණවලින් කුහුලට පත්වූහ. ඒවා යම්කිසි ජීව විශේෂයක් විසින් තනන ලද ජල මාර්ග යැයි ඔවුහු සැලකූහ.

ඉතා ධනවත් අජටාකාශ විද්‍යාඥයෙකු වූ පර්සිවල් ලවල්, අඟහරු තලය පරීක්ෂා කරනු පිණිස විශේෂ ග්‍රහලෝක පරීක්ෂණාගාරයක් පිහිටුවා ලූයේය. 1908 වන විට ඔහු අඟහරු තලයෙහි 'ඇළවල්' සිය ගණනකට ඔහු කැමති නම් තබා තිබුණේය.

ඔහු විශ්වාස කළේ මේ 'ඇළවල්' තනන්ට ඇත්තේ අඟහරු ලොව උත්තරධ්‍රැවයේ සිට, එහි



සෝජර්නර් රෝවරය ගමන් අරඹමින්. පසෙකින් තිබෙන්නේ පාත්ෆයින්ඩර් යානයයි

සෙසු පෙදෙස්වල පිහිටි ජලය විරහිත නගරවලට ජලය සම්පාදනය කරනු පිණිස යැයි කියාය.

ලවල්ගේ ආභාසයෙන් බ්‍රිතාන්‍ය නවකථා කලාකාර එච්. ජී. වෙල්ස් 'වෝ ඔෆ් ද වර්ල්ස්' (ලෝක අතර යුද්ධය) නමින් විද්‍යා ප්‍රබන්ධ කථාවක් කළේය. එහි කියැවෙන්නේ අඟහරු ලොවින් ආ පිරිසක් පෘථිවිය ආක්‍රමණය කරන ආකාරයයි. ඒ 'අඟහරුවන්' විස්තර කෙරුනේ බූවල්ලන් වැනි සත්ව විශේෂයක් හැටියටය. 1938 දී ඕර්සන් වෙල්ස් නම් සුප්‍රසිද්ධ නළුවා, එච්. ජී. වෙල්ස් ගේ නවකථාව පදනම් කොටගෙන ගුවන් විදුලි නාට්‍යයක් කළේය. ඇමෙරිකාවේ ගුවන් විදුලි ශ්‍රාවකයන්බොහෝ දෙනා ඉන් තැති ගත්තේ ඇත්තටම අඟහරුවන් පෘථිවිය ආක්‍රමණය කළ හැටි සිතමිනි.අඟහරු තලයේ ජීවීන් සිටියත් නැතත් අඟහරු ලොව පිළිබඳ පර්යේෂණ දිගටම පැවැත්වේ.

දැනට කෙරෙන පර්යේෂණවලින් අඟහරු ජීවීන් පිළිබඳව කවර මත ප්‍රකාශ වේදැයි කිව නොහේ. එහෙත් සුප්‍රසිද්ධ බ්‍රිතාන්‍ය අජටාකාශ විද්‍යාඥයෙකු වන සර් ෆ්‍රෙඩ් හොයිල් ගේ මතය මෙහිදී සලකනු වටී. ඔහු විසින් ඉදිරිපත් කෙරෙන න්‍යායක් වෙයි.

එය හැඳින්වෙන්නේ විශ්ව බීජ න්‍යායය පැන් ස්පර්මියා (Panspermia) වශයෙනි. ඉන් කියැවෙන්නේ මීට අවුරුදු කෝටි සිය ගණනකට පෙර විශ්ව පුරාම ජීව බීජ විසිර - විහිද තිබුණු බවයි. ඒ නිසා විශ්වයේ බොහෝ තැන්වල ජීවය හටගන්නට ඇතැයි ඔහු ඉඟි කරයි.

'පෘථිවි වාසී මිනිසුන් අඟහරුවන් විය හැකියි, කවුරු දනිද්ද'යි ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාඥ රිචඩ් සෙයා පවසයි. ජීව බීජ අඟහරු ලොව සිට උල්කාපාත මත පෘථිවියට අවුත් ජීවය ප්‍රභවය විදැයි ඔහු සැක කරයි.

මෙසේ අඟහරු තලය මත ජීවීන් සෙවීම නොනවත්වා සිදුවන පර්යේෂණ ප්‍රයත්නයකි.

1997 තේ නොවැම්බර් 11 වනද හා 12 වනද තවත් අඟහරු පර්යේෂණ යාත්‍රා දෙකක් අඟහරු ග්‍රහයා වෙත ගමන් ගනිති.

මේ සියල්ලෙන් ම එකට එකතුවන දැනුම් සම්භාරය නිසා ජීවය පිළිබඳ අප සතු මත පූර්ණ විප්ලවයකටත් භාජන විය හැකිය. ❑

දැනට කෙරෙන පර්යේෂණවලින් අඟහරු ජීවීන් පිළිබඳව කවර මත ප්‍රකාශ වේදැයි කිව නොහේ. එහෙත් සුප්‍රසිද්ධ බ්‍රිතාන්‍ය අජටාකාශ විද්‍යාඥයෙකු වන සර් ෆ්‍රෙඩ් හොයිල්ගේ මතය මෙහිදී සලකනු වටී.




නාසා ආයතනයේ ජෙට් ප්‍රචාලන අංශයේ ප්‍රධාන ඉංජිනේරු රොබට් මැනිං (දකුණේ ඉදිරිපස) හා අනෙකුත් විද්‍යාඥයින් යානය අඟහරු මතට ගොඩ බැස්ස මොහොතේ උද්දාමයට පත්වෙමින්